# පුංචි අප්පුහාමීගේ A4 කොළය



තනූජා මනෝරී රත්නායක

# පුංචි අප්පුහාමිගේ A4 කොළය

තනුජා මනෝරී රත්නායක

කතෘ

මහාමායා බාලිකා විදුහල - මහනුවර
ආදිශිෂ්‍ය
1996 කණ්ඩායම

ප්‍රකාශිත දිනය 2026-07-12

ISBN 978-624-211-493-4

# ~ පිදුම ~

වර්තමාන විදුහල්පතිතුමිය වන ශශිකලා සේනාධීර මියටත්, ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම් සර්ටත් මේ සඳහා අප උනන්දු කල සහකාර විදුහල්පති තුමිය වන දිල්රුකා ඇරැගොඩ මියටත්, සියලුම සංවිධානය මණ්ඩලයේ ගුරුමහත්මීන්ටත් ලබාදුන් නොසැලෙන සහයෝගය සහ මගපෙන්වීමත් වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය.

මහනුවර මහාමායා බාලිකා විදුහලේ 1996 කණ්ඩායමේ ආදි ශිෂ්‍යාවක් ලෙස මා මෙම E-Book ව්‍යාපෘතියේ සංවිධානය මණ්ඩලයේ වසර 5ක කාලයක් සහාය දක්වන අතර මහාමායාවේ මෙන්ම විවිධ පාසල් වල දරුවන්ගේ අප්‍රමාණ රචනා නිර්මාණ දක්ෂතා මෙම කාලය තුළ නිතර දර්ශනය වන්නට විය. ඒ අනුව හේමමාලා කුමරී උපහාර ව්‍යාපෘතියේ ග්‍රන්ථයක් රචනා කර ව්‍යාපෘතියේ දායකත්වයට මා ද මාගේ දියණිය හා පුතණුවන් සමග එකතු වීම ජීවිතයේ ලද ඉමහත් භාග්‍යක් ලෙස සලකමි.

මා ඉගනගත් පාසලේ අකුරු කියාදුන් සියලුම ගුරුවරුන්ට පුංචි දු පුතුන්ට මේ කුඩා උත්සාහයට ආදරයෙන් පිදේ.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

නමින් පුංචි අප්පුහාමි. වයස දහයයි.



කොණ්ඩේ අවුල්,

චීත්ත කමිසේ,

හැමදාම සෙරප්පු දෙක වෙලාවකට දානවා වෙලාවකට නෑ........

හරිම දඟයි,

හිනාවෙන එකමයි වැඩේ. හැමවෙලේම ප්‍රශ්නයක් අහනගමන් ඉන්නේ. දඟ උනාට හිත හොඳයි. සෙල්ලමටමයි හිත. එයාගේ යාළුවා “බුකී”. ඌ සුනඛයෙක්. එයා එක්ක තමයි හැම වැඩක්ම කලේ.



පුංචි
අප්පුහාමි........

ඉර පායන්න
කලින්ම
ඇහැරුණා.
හැබැයි
ඉස්කෝලේ යන්න
නෙවෙයි.

කුස්සියේ අග්ගලා
සුවඳට ........

දත් මැදලත් නෑ
........ ඒත්
නිදිමතේම
දුවගන ආවේ
කුස්සියට ........

අම්මේ..... අග්ගලා තුනක් දෙන්නකෝ ! අප්පුහාමි කෑගැහුවා.

“ඉස්කෝලේ වැඩ ඔක්කොම කරොත් අග්ගලා හයක්ම දෙනවා” අම්මා කීවා.

පුංචි අප්පුහාමි අග්ගලා භාජනය බලලා ඇස් ලොකු කරගන කෙල ගිලිනවා.

"අම්මේ පොඩී අග්ගලයක් දෙන්නකෝ....... පොඩ්ඩක් විතරයිනේ ඉල්ලුවේ අම්මේ......."



අම්මා පොල් හැන්ද උස්සලා හිනාවුනා.

"පාඩම් ටික ඉවර කරලා එන්න මගේ පුතේ. ඊට පස්සේ කැවුම් හයක්ම දෙන්නම් කෝ."

පුංචි අප්පුහාමිගේ මූණ එල්ලුනා. ඒත් අග්ගලා කන්න ආසාවට එයා පොතයි පැන්සලයි අරන් දිව්වා....... බුකීත් පස්සෙන් දිව්වා. ඉක්මණින් ඉස්කෝලෙ වැඩ කලා....

වැඩ අවසන් කරලා පුංචි අප්පු කුස්සියට දිව්වා. අම්මා හරිම ආදරෙන් පුංචි අප්පුට අග්ගලා පිගානක් දුන්නා....




පුංචි අප්පුට හරීම සතුටුයි.

“අම්මේ........
පාඩම් කලාම මට හැමදාම අග්ගලා දෙනවද........”

“ඔව් ඔව්...... මගේ පුතා දක්ෂයෙක් වෙනකොට අම්මාට පුදුම සතුටක් දැනෙනවා........” අම්මා අග්ගලා දෙන ගමන් පුංචි අප්පුගේ ඔළුව අතගෑවා. අප්පුට පොඩ් ආඩම්බරයක් දැනුනා.

අග්ගලා කන ගමන් ඉස්කෝලෙන් කියාදුන්න තාක්ෂණය ගැනත් පුංචි අප්පුහාමි අම්මාට කීවා........ අම්මා එයාගේ දුරකථනය අප්පුට පාවිච්චි කරන ආකාරයත් පාඩම් බලන අකාරයත් කියලා දුන්නා........ අප්පුහාමි අම්මාගේ





දුරකථනයෙන් YOU TUBE බලලා බුකීට ඉංග්‍රිසි උගන්වන්න පටන් ගත්තා........

දවසක් බුකීට

"බුකී Sit" කියලා අප්පු කෑගැහුවා........ බුකී බයවෙලා අල්ලපු ගෙදර වත්තේ කුකුළව එලෙව්වා........ පුංචි අප්පුට හොඳටම හිනා........ "බුකී come" කියලා කීවට බුකී ආවේ නෑ.ඒත් බත් කන්න කතා කරන කොට එනවා.

බුකීට සිංහල ඉංග්‍රිසි නෙවෙයි ආදරේ භාෂාව තමයි තේරෙන්නේ කියලා අප්පුට තේරුනා.



එදා ඉස්කෝලේ දවසක්.

ගුරුතුමිය පාසලට අලුතින් හඳුන්වා දුන් E-Book ව්‍යාපෘතිය ගැන හැමෝටම පැහැදිලි කලා. "පංතියේ හැමෝම එකතුවෙලා එක චිත්‍ර පොතක් හදමු. පංතියේ නමත් දාමු. හැමෝම ඒකට චිත්‍රයක් අඳින්න ඕන."

අප්පුහාමිට උදේ තිබුන හදිස්සියට පැන්සල් දාන පෙට්ටිය ගන්න අමතක වෙලා.

ඉස්කෝලේ ගිහින් බලනකොට පැන්සල පෙට්ටිය නෑ. අප්පුහාමි අඬන්න පටන් ගත්තා.

එහා පැත්තේ හිටපු පොඩි බණ්ඩා අප්පු ලගට ඇවිත් පැන්සලක් දුන්නා. අප්පුට හරි සතුටුයි.

ගුරුතුමිය තවත් E Book ව්‍යාපෘතියේ තොරතුරු පැහැදිලි කලා.



අන්තර්ජාලයටත් අපේ නිර්මාණ ඇතුලත් කරන බව කීවා. චිත්‍රය අඳින්න අප්පුහාමිට A4 කොලයක් තිබුනේ නැති බව ගුරුතුමිය දැක්කා. “A4 කොලයක් නැත්නම් චිත්‍ර පොතේ අඳින්න.” ගුරුතුමිය කීවා.

පුංචි අප්පු චිත්‍ර පොතත් ගෙනත් නෑ. ආය යාළුවන්ට කරදර කරන්න බෑ. පුංචි අප්පුට සිතුනා.

අම්මා උදේ බත් දාලා කෙසෙල් කොලය ඔතලා දීපු සුදු කඩදාසිය තාමත් අලුත් වගේ බෑග් එකේ තිබුනා. ඒක බෑග් එක යටටම ගිහින්.

පුංචි අප්පුහාමි හෙමිට කොලය එළියට ගත්තා. මේසයේ තියලා පැතලි කලා. ගුරුතුමිය දකිද දන්නේ නෑ කියලා හිත හිත පොඩි බණ්ඩා දුන්න පැන්සල අරන් ලස්සන චිත්‍රයක් ඇන්දා.

හැමෝගෙම චිත්‍ර ගුරුතුමිය එකතු කලා.



පොඩි බණ්ඩා කල උදව්ව ගුරුතුමිය අගය කලා. අප්පුයි බණ්ඩයි හොඳම යාළුවෝත් උනා.

"හැමෝටම උදව් කරන්න අපි **ඉස්කෝලේ උදව් පෙට්ටියක්** හදමු"



කියලා අප්පු කීවා. බණ්ඩත් කැමති උනා. ගුරුතුමියත් යෝජනාවට එකග උනා. හැමෝම තමන්ට වැඩිපුර තියන පැන්සල්, මකන, පොත්, පාට පැන්සල් ඒකට දැම්මා. ඒවා නැති අය ඒකෙන් ගත්තා.

ගුරුතුමිය පාසලේදී හැමෝවම දැනුවත් කලා පෙර දිනයක චිත්‍ර නිර්මාණය කල හැමෝම පසුදින උදෑසන පාසල් රැස්වීමට ඉතා පිරිසිදුවට නිල ඇදුමින් සැරසී එන ලෙසට.

“අම්මේ ගුරුතුමී හෙට චිත්‍ර ඇන්ද හැමෝටම ලස්සනට එන්න කීවා ......” අප්පු කෑගැහුවා.

“අනේ....... හරිම ශෝක් නේ පුතේ. ඔයත් අනිත් අය වගේම හෙට ලස්සනට ඉදි.” අම්මගේ ආදරය ඇස් වලින් තෙත් වුණා.



අප්පුත් හරිම සතුටින් සැකෙන් එදිනට යාම සිතමින්ම බූකි සමඟ නින්දට වැටුනා. අප්පු ඇදේ හාන්සි උනාට ඇස් අරිනවා....... වහනවා.......රැස්වීමේ හීන දකිනවා.“ ගුරුතුමිය මට මොනවා කියයි ද?....... මගේ චිත්‍රය අයින් කරලද?.......හෙට මගේ නම නැතිවෙයි ද?....... තමන්ටම කීවා”




උදෑසන කකුළා හඬලනවා ඇසුන පුංචි අප්පු වෙනදට වඩා කලබලයෙන් මුහුණ කට සෝදා අම්මා මැද එල්ලා තිබූ කමිසය සහ කලිසම ඇද ගත්තා. පුටුව යට ඔපදැමූ සපත්තු ජෝඩුවද විගසින් දා ගත් ඔහු කොණ්ඩේ පීරන ගමන් කණ්ණාඩිය සමග සිනාසුනේ ජායා රූපයට පෙර පුහුණුවටයි.

පාරේ යන ගමන් බණ්ඩා හමුවේ යයි සිතූ අප්පු පසු පසින් එයි යයි සිතා යන ගමනට පසුපසටත් ගමන් කලා. එදින උදෑසන සියළුම දෙනා ඉතාම අලංකාරව පාසලට පැමිණ සිටියා.

උදෑසන රැස්වීමට සියලුම දෙනා පිට්ටනියට එකතු වුනා. වන්නේ මොනවාදැයි කිසිවක් නොදන්නා සියළුම සිසුන් කුතුහලයෙන් ඉදිරිය බලා සිටියා.

"බණ්ඩා ....... විදුහල්පති අද මට කතා කරයිද......." අප්පු බණ්ඩාගේ කනට කරලා ඇහුවා.



"කතා කරයි ඔයාගේ චිත්‍රය ලස්සනයි. මම දැක්කානේ........" බණ්ඩා කීවා.

"ඒ උනාට බණ්ඩා මගේ කොළය වැරදිනේ.......මගේ හිතටත් මොකක්ද වගේ. ඒක අයින් කරලද දන්නේ නෑ. අන්තර්ජාලයට ඔය කොලවල පින්තූර දාන් නෑනේ......" අප්පු කීවා.

"එහෙම උනොත් ඔයා A4 කොලයක නැවත ඇදලා දෙන්න. ඒත් අන්තර්ජාලයට යවන නිසා තමයි මුකුත්ම හිතාගන්න බැරි. මට ඕක තේරුනේම නෑනේ. අපරාදේ ඔයාට මගෙන් කොලයක් ඉල්ලන්න තිබුනානේ......" තිස්ස කීවා.

"හ්ම් ......බලමු......වෙන දෙයක් බාර ගන්නවා. නොතේරුනොත් ගුරුතුමියගෙන් අහලා ආපහු එකක් A4 කොලයක අදිනවා" පුංචි අප්පු කීවා.




විදුහල්පතිනිය අප්පුගේ පංතියේ හැමෝගෙම චිත්‍ර සඳහා පදක්කමක් ලබා දුන්නා. අවසානය තෙක් ඔහුගේ නම නොකියූ බැවින් පුංචි අප්පු ඉතාම කණගාටුවට පත් වුනා.

එකවරම අප්පුගේ නම හඬනැගුනා.

"අද දින විශේෂ ඇගයීමක් තියනවා....... අපේ පාසලට පුස්තකාල සංගමය මගින් දරුවන්ගේ නිර්මාණ නව තාක්ෂණය සමගින් අන්තර්ජාලයට යොමු කිරීමේ අරමුණින් අලුතින් හදුන්වාදුන් E-Book ව්‍යාපෘතිය සඳහා චිත්‍ර නිර්මාණයෙන් A4 කොලයක් වෙනුවට තමන්ගේ නිවසින් ඔතාගෙන ආ බත් ඔතතලද කඩදාසිය අවස්ථාව අනුව සිතා බලා භාවිත කරමින් අලංකාරම චිත්‍රය නිර්මාණය කල අප්පුට පාසලේ විශේෂ ඇගයීම පිරිනමනු ලබනවා......"

අත්පොළසන් පාසල පුරා ඇසෙන්නට විය. බණ්ඩා ඇතුළු යහළුවන් පිරිස එක හඬට කෑගැසීය. අප්පුට හරීම සතුටුයි.

“Thank you Madam” ලැජ්ජාවෙන්, සතුටෙන් පුංචි අප්පුගේ ඇස් දිලිසුනා.



හැමෝම ඔහුගේ උත්සාහය අය කලා. පංතියේ ගුරුතුමිය තෙත් වූ දෑසින් ආඩම්බරෙන් අත්පුඩි ගහනවා.

පොඩි කැපවීමකින් පටන්ගත් වැඩක්, ලොකු හිනාවකින් ඉවර උනා.

මහන්සි උනාම හැම හීනයම ඇත්ත වෙනවා.

මෙය පුංචි අප්පුගේ ජීවිතයේ ආරම්භයක් පමණයි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-493-4